# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 159/5 — 1975 අප්‍රේල් 17 වැනි බ්‍රහස්පතින්ද — 1975.04.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### මිළ පාලන පනත

කළුතර කච්චෙරියේ වි.ලි.සේ. 1 වැනි ශ්‍රෙණියේ ලිපිකරු, ජී. ඒ. ද සිල්වා මහතා සිය රාජකාරිවලට අමතරව කළුතර දිස්ත්‍රික්කයේ (ආහාර හා විවිධ ද්‍රව්‍ය) සහකාර මිළ පාලකවරයකු වශයෙන් මිළ පාලන පනතේ 2 වැනි වගන්තිය යටතේ විදේශීය හා දේශීය වෙළඳ ඇමතිවරයා විසින් 1972 මැයි මස 3 වැනි දින සිට වලංගු වන පරිදි කර තිබූ පත්වීම වහාම ක්‍රියාත්මක වන පරිදි එතුමා විසින් අවලංගු කර තිබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය

1975 අප්‍රේල් මස 7 වැනි දින,
කොළඹදීය.

4–512

---

### අංක 157 දරණ අත්කරගැනීමේ ආඥාව

### 1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත

### 10 වෙනි වගන්තිය යටතේ ආඥාව

1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනතේ 10(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, විදේශීය හා දේශීය වෙළඳ ඇමති, ටිකිරි බණ්ඩා ඉලංගරත්න වන මම, මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිත දේපල (ලියාපදිංචි කිරීමේ අංක ම 2427 දරණ) සීමාසහිත මහනුවර විවිධ සේවා සමුපකාර සමිතියේ යම් ව්‍යාපාරයක කාර්යයන් සඳහා එකී සමිතිය විසින් ප්‍රයෝජනයට ගත හැකිවනු පිණිස 1975 අප්‍රේල් මස 30 වැනි දින සිට මෙම ආඥාව මගින් අත්කරගනිමි.

ටී. බී. ඉලංගරත්න,
විදේශීය හා දේශීය වෙළඳ ඇමති.

1975 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹදීය.

#### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ, කටුකැලේ ග්‍රාමසේවක කොට්ඨාශයෙහි පිහිටි, වරිපනම් අංක 38 දරණ වර්ග අඩි 2,640ක් පමණ ඇති එම්. මොහිඩ් මහතාට අයිති මෙහි පහත අයුරින් මායිම්වූ දෙමහල් ගොඩනැගිල්ල :—

උතුරට : රිමාන්ඩ් බන්ධනාගාර ගොඩනැගිල්ල ;

නැගෙනහිරට : වරිපනම් අංක 36 සිරිමත් බෙනට් සොයිසා වීදිය ;

දකුණට : සිරිමත් බෙනට් සොයිසා වීදිය ;

බස්නාහිරට : වරිපනම් අංක 40 සිරිමත් බෙනට් සොයිසා වීදිය.

4–513


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

1A—ඒ 13465–4,325 (75/03)